සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 11 | විෂයය / பாடம் / Subject : නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper : II | කාලය / காலம் / Time : පැය 02 |

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(1) රණබෙර වාදනයෙන් .......................... රසය ලබාදීමට වාදකයෝ උත්සහ ගනිති.
(2) නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිත කරන ආකාරය ලියා දැක්වීම .......................... යි.
(3) කෝලම් රඟමඬල .......................... නමින් හඳුන්වනු ලැබේ.
(4) අංගරචනය අයත් වනුයේ .......................... අභිනයට ය.
(5) .......................... වර්ෂයේ දී අ.පො.ස. (උ.පෙළ) විෂය මාලාවට නර්තන විෂය ඇතුළත් කරන ලදී.
(6) පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ සරස්වතී මණ්ඩපය ඇතුළු නාටකශාලා ඉදිකළ බව .......................... සඳහන් වේ.
(7) 'හපනා' ළමා මුද්‍රා නාට්‍ය .......................... මහත්මියගේ නිර්මාණයකි.
(8) චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කරන ලද .......................... මුද්‍රා නාට්‍යයෙහි කතා තේමාව ධීවර ජන ජීවිතය හා සම්බන්ධ වේ.
(9) රාස්ලීලා නර්තන අංගය .......................... නර්තන සම්ප්‍රදායෙහි දක්නට ලැබෙන අතර .......................... නර්තන සම්ප්‍රදාය 'කේරළ කලා මණ්ඩලම්' හි උගන්වනු ලැබේ.
(10) .......................... නර්තනයේ දී රාජසභා ලක්ෂණ දක්නට ලැබෙන නිසා ප්‍රශස්ති කවි ගායනා කරනු ලබන අතර .......................... නර්තනයේ දී 'හටන් කවි භාවිත කරනු ලැබේ.

(ලකුණු 01 x 12 = 12)

(02) (1) මාත්‍රා 3 + 3 තාලරූපයට අයත් බෙරපදයක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 02)
(2) මාත්‍රා 4 + 4 තාල රූපයට අයත් කවිපදයක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 04)
(3) මාත්‍රා 2 + 4 තාලරූපයට අයත් කස්තිරමක් / ඉරට්ටියක් / මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් කලාසමක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 06)

(03) දේශීය ශාන්ති කර්ම ජන ජීවිතය හා බැඳී ඇත.
(1) ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු 02ක් ලියන්න. (ලකුණු 02)
(2) ඔබ උගත් ශාන්ති කර්මයක ඇතුළත් චාරිත්‍ර විධි 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
(3) සමාජ සහජීවනය සඳහා ශාන්තිකර්ම ඉවහල්වන ආකාරය උදාහරණ 02ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

Department of Education – Western Province

(04) (1) කෘෂිකර්මාන්තය හා බැඳි ගැමි නර්තන 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඉන් එක් නර්තනයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(3) ගැමි නර්තනයක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 03ක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) පහත රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

(1) A හා B රූපවලින් දක්වෙන නර්තන සම්ප්‍රදායන් 02 නම් කරන්න. (ලකුණු 02)

(2) B රූපයෙන් දක්වෙන නර්තන සම්ප්‍රදායෙහි භාවිත සංගීතය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

(3) A රූපයෙන් දක්වෙන නර්තන සම්ප්‍රදාය 'ආහාර්ය අභිනයෙන් පොහොසත්ය' පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (1) නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) වර්තමානයේ ආගමික කටයුතු සඳහා වාදනය භාවිත කරන අවස්ථා 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(3) 1970න් පසු නර්තන අධ්‍යාපනයේ ඇති වූ නව ප්‍රවණතා 02ක් විමසුමට ලක්කරන්න. (ලකුණු 06)

(07) (1) රූපවාහිනී නාලිකාවල විකාශය වන ළමා නර්තන වැඩසටහන්හි විනිශ්චය සඳහා සහභාගි වන ප්‍රවීන නර්තන ශිල්පීන්/ ශිල්පිනියන් 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) නිර්මාණාත්මක නර්තන අංග විචිත්‍රවත් කිරීමට යොදා ගත හැකි උපක්‍රම 04ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) රූපවාහිනී නාලිකාවල විකාශය වන ළමා නර්තන වැඩසටහන් නැරඹීමෙන් අපට ඉගෙනගත හැකි දේ බොහෝ ය.' ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

Department of Education – Western